Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය 2023**

**කලාප මට්ටම**

**පද්‍ය නිර්මාණ හා අවබෝධය**

**06 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

- අපේක්ෂකයාගේ නම :- ..............................................................................................
- විද්‍යාලයේ නම සහ ලිපිනය:-.............................................................................................................
- කලාපය:- .............................................................................................................................
- පාසල් වර්ගය:-200 තෙක්/ 201 සිට 500/ 500 ට වැඩි.

**ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු ලියන්න**

01. පහත ඇති කවි කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

වැස්ස වහිනවා - වහලෙ වතුර වැටෙනවා
වැටෙන වතුර අල්ලන කොට - අම්ම බනිනවා

ගොඩක් වහිනවා - මිදුලෙ වතුර ගලනවා
දුවල ගිහින් තෙමිල තෙමිල - එන්න හිතෙනවා

බෝල හැදෙනවා - වතුරෙ බෝල නටනවා
අල්ල ගන්න හදනකොට ම - ඒවා බිඳෙනවා

කුඩේ ගන්නවා අම්ම - කඩේට යනවා
කුඩේ අරන් මටත් කඩේ - යන්න හිතෙනවා

i. මෙහි සඳහන් අවස්ථාව කුමක් ද?..............................................................................................
ii. මෙම කවියේ සඳහන් වන දෙදෙනා කවු ද?...............................................................................
iii. අම්මා බනින්නේ ඇයි ?..............................................................................................................
..............................................................................................................................
iv. මෙම කවි කියන කෙනාට හිතෙන දේවල් දෙකක් ලියන්න?
.....................................................................................................................................
.....................................................................................................................................
v. මෙහි සඳහන් ආකාරයට අල්ලන විට බිඳෙන්නේ මොනවා ද?
...................................................................................................................................

(ලකුණු 10 යි )

02. පෙළපොතේ සඳහන් පහත ඇති කවිවල ඉතිරි පද ලියන්න.

(i) වැස්ස වගේ අකාසෙන් වහින්න මට ආසයි
...............................................................................
ලියැදි දිගේ එහෙන් මෙහෙන් ගලන්න මං ආසයි
...............................................................................

(ii) පිපේ නෙලුම් ඕලු ගහේ විලේ ඇලේ
තිබේ වලාකුළු පහ වී නිලේ වෙලේ
...............................................................................
...............................................................................

(ලකුණු 10 යි )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

03. පහත උදාහරණය දෙස බලා දී ඇති පදවලට උපමා ලියන්න.
උදා :- අලියා - අලියා කළුගලක් වැනි ය.

I නංගිගේ මුහුණ-...................................................................................................................
II අම්මා - ...................................................................................................................
III හාවා - ...................................................................................................................
IV ඉර - ...................................................................................................................
V රෑ අහස - ...................................................................................................................

(ලකුණු2x5 = 10 යි )

04. පහත උදාහරණය දෙස බලා දී ඇති පදවලට සංකේත යොදන්න.

| | පදය | සංකේත |
|---|---|---|
| උදා | මාසය | U - - |
| i | ළමයා | |
| ii | කාලය | |
| iii | රබාන | |
| iv | තාරාවා | |
| v | සාලයා | |

(ලකුණු2x5 = 10 යි )

05.පහත මාරු කර දී ඇති වචන ගළපා කවි පද නිර්මාණය කරන්න.

i. උඩින් / හිරු /කන්ද / වඩිනවා / කුමරු
...................................................................................................................
ii. අග /තුරු /පුදිනවා /මල් /හෙමිහිට
...................................................................................................................
iii. ගයනවා /මලිත්තෝ / බටිති / ගීත
...................................................................................................................
iv. සිත /අපේ / පුංචි /පිරෙනවා /සතුට
...................................................................................................................

(ලකුණු2x4 = 08 යි)

06.පහත කවිවල අඩු පද නිර්මාණය කර ලියන්න.

(i) කිරි මැණිකෙගෙ ටිකිරි සිනා
වැහි වතුරට එකතු වුණා
ගමේ වැවට ගොස් වැටුණා
.........................................................

(ii) අහසේ තරු දිලිසෙනවා
හඳ මාමා නැග එනවා
.........................................................
.........................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(iii) සුළඟක් වී සිසිල දෙන්න මං හරි ආසයි
වැස්සක් වී ඇඳ හැලෙන්න මං හරි ආසයි
.....................................................................
.....................................................................

(ලකුණු3x5 = 15 යි)

07. පහත දැක්වෙන පින්තූරය හොඳින් නිරීක්ෂණය කර ඔබේ සිතේ මැවෙන සංකල්ප ඇසුරෙන් කැමති විරිතක් අනුව සිවුපද 08 කට නො අඩු පැදිපෙළක් නිර්මාණය කරන්න. සුදුසු මාතෘකාවක් යොදන්න.



(ලකුණු 7යි)

.....................................................................
.....................................................................
.....................................................................
.....................................................................
.....................................................................
.....................................................................
.....................................................................

.....................................................................
.....................................................................
.....................................................................
.....................................................................
.....................................................................
.....................................................................
.....................................................................

.....................................................................
.....................................................................
.....................................................................
.....................................................................
.....................................................................
.....................................................................
.....................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

08 පහත දී ඇති මාතෘකාවලින් දෙකක් තෝරා ගෙන කවි දෙක බැගින් ලියන්න.

(i) උදෑසන
(ii) මුහුදු වෙරළ
(iii) මගේ අම්මා
(iv) මගේ හුරතලා

( එක් නිර්මාණයකට 15 බැගින් ලකුණු 30)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය 2023**

**කලාප මට්ටම**

**පද්‍ය නිර්මාණය හා අවබෝධය**

**07 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

❖ අපේක්ෂකයාගේ නම :- ..........................................................................................

❖ විදුහලේ නම සහ ලිපිනය:-..........................................................................................

❖ කලාපය:- ..........................................................................................

❖ පාසල් වර්ගය:-200 තෙක්/ 201 සිට 500/ 500 ට වැඩි.

➢ පළමුවන කොටසට අයත් සියලු ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.
➢ 11 කොටසේ (අ) , (ආ) කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු ලියන්න.
➢ පිළිතුරු ලිවීම සඳහා ලියන කඩදාසි භාවිත කරන්න.

01. පහත ළමා ගීතය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න

සමන් පිච්ච මල් ඉහිරුණු
නිල් තණකොළ පිට්ටනියක්
වගෙයි අහස අන්න බලනු
කොච්චර ලස්සන ද රෑට

බකමූණෝ පියාඹති
අනෙක් කුරුල්ලෝ නිදති
බෝ අතුවල එල්ලීගෙන
මා වවුලෝ කෑ ගසති

මගේ සුරතල් අක්කාගේ
මාලේ මුතු ඇට වගේ
මේ වැටෙන්නේ පිනි බිංදුත්
හදමු එකක් ඒ වගේ

i. මෙම ගීතයෙන් කියවෙන අවස්ථාව කුමක් ද?

..........................................................................................

ii. මෙහි සඳහන් නිශාචර පක්ෂීන් කවු ද?

..........................................................................................

iii. පහත සඳහන් දේවල් උපමා කර ඇත්තේ මොනවාට ද?

අහස -..........................................................................................

පිනි බිංදු -..........................................................................................

iv. මෙහි සඳහන් නාම විශේෂණ දෙකක් ලියන්න.

1.................................................... 2....................................................

v. මෙම ගීතයේ රචකයා කවු ද ?

....................................................-....................................................

(ලකුණු 10 යි)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

02. පහත උදාහරණය දෙස බලා දී ඇති වස්තූන්ට උපමා ලියන්න.

උදා : අලියා - අලියා කළුගලක් වැනි ය.

i. පෝදා සඳ - ..........................................................................................................

ii. හාවා - ..........................................................................................................

iii. වැව - ..........................................................................................................

iv. වැස්සෙන් පිරුණු ඇල -..........................................................................................................

v. පුංචි ළමයි - ..........................................................................................................

(ලකුණු 05 යි)

03. පහත දී ඇති උදාහරණය දෙස බලා දී ඇති උපමා , රූපක බවට පත් කර ලියන්න.

උදා:- නංගිගේ හිනාව පිච්ච පොකුරක් වැනි ය.

- නංගිගේ හිනාව පිච්ච පොකුරකි.

i. අම්මාගේ මුහුණ සඳක් වැනි ය

..........................................................................................................

ii. තාත්තා හිරු වැනි ය.

..........................................................................................................

iii. නංගිගේ මුහුණ රෝස මලක් වැනි ය.

..........................................................................................................

iv. අක්කාගේ වරලස කිතුල් මලක් වැනි ය.

..........................................................................................................

v. කොහාගේ හඬ මිහිරි ගීයක් වැනි ය .

..........................................................................................................

(ලකුණු 10 යි)

04. පහත උදාහරණය දෙස බලා දී ඇති පදවලට සංකේත යොදන්න.

| | පදය | සංකේත |
|---|---|---|
| උදා | කමලා | |
| i | සාලය | |
| ii | පළාත | |
| iii | වලසා | |
| iv | තාරාවා | |
| v | පරාටා | |

(ලකුණු 05 යි)

05. ඔබ කැමති ලෙස නිර්මාණය කර ගත් පද යොදා පහත සඳහන් කවි සම්පූර්ණ කරන්න.

(i) මලක මලක් පිපුණු වගක්

කවුද කියනවා

ඒ මල වට බඹරු ඇවිත්

..............................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(ii) ටික්කි ටිකිරි වතු සුදු මල්
සිල් අරගෙන මෙහි හැමකල්
..............................................................
..............................................................

(ලකුණු 05 යි)

06. පහත දැක්වෙන කවි පැනවලට අදාළ විරිතින් පිළිතුරු ලියන්න.

(i) හිරු නැග එනවාලු
මල් හිනැහෙනවාලු
පාසල් යමු යාළු
ඇයි තව නිදි යාළු

(ii) වේයා හරිම පොඩියිනේ
ඒත් තුඹස ලොකුයිනේ
කොහොමද එය කරන්නේ
අම්මේ මට කියන්නේ

(ලකුණු 05 යි)

07. පහත දැක්වෙන පින්තූරය හොඳින් නිරීක්ෂණය කර ඔබේ සිතේ මැවෙන සංකල්ප ඇසුරෙන් කැමති විරිතක් අනුව සිවුපද 08 කට නො අඩු පැදිපෙළක් නිර්මාණය කරන්න. සුදුසු මාතෘකාවක් යොදන්න.



(ලකුණු 10 යි)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**11 කොටස**

පහත දැක්වෙන (අ) කොටසින් එක් කොටසක් හෝ (ආ) කොටසේ කොටස් දෙකෙන් එක් කොටසක් හෝ තෝරාගෙන පද්‍ය 08 කට නො අඩු පද්‍ය රචනාවක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) (i) රළ පිට රළ පෙරළි පෙරළි
වෙරළට එනවා
සුදු වැල්ලේ පෙණ කැටි කැටි
විසිරී යනවා

(ii) පොත් කියවමු - දැනුම ලබමු
අපි පිරිපුන් මිනිසුන් වෙමු

(iii) පුන් සඳ පායා රැස් විහිදන්නේ
තරු මල් පිපිලා සිනා සලන්නේ

(iv) කඳු මුදුනෙන් බිමට වැටී
ගල පරවල ගැටී
මතු කරමින් සුමුදු කැටී
ඒ ලස්සන බලනු වටී

(ආ) (i) ලෝක ළමා දිනය දවසේ උදෑසන රැස්වීම අමතා කරන කතාව කවියෙන් ලියන්න.

(ii) “මවකගේ අගය” යන තේමාව යටතේ පැදි පෙළක් තනන්න.

(ලකුණු 50 යි)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය 2023**
**කලාප මට්ටම**
**පද්‍ය නිර්මාණය හා අවබෝධය**

**08 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

**පළමු කොටස**

- අපේක්ෂකයාගේ නම :- ........................................................................................
- විද්‍යාලයේ නම සහ ලිපිනය:-.................................................................................
- කලාපය:- ..........................................................................................................
- පාසල් වර්ගය:-200 තෙක්/ 201 සිට 500/ 500 ට වැඩි.

- පළමුවන කොටසට අයත් සියලු ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.
- 11 කොටසේ (අ) , (ආ) කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු ලියන්න.
- පිළිතුරු ලිවීම සඳහා ලියන කඩදාසි භාවිත කරන්න.

**1 කොටස**

01. ‘තරු මල් හිනැහේ සතුටින් ’ යන වැකිය පද මාරු කොට මෙසේ ද ලිවිය හැක.

- තරු මල් සතුටින් හිනැහේ
- හිනැහේ තරු මල් සතුටින්
- සතුටින් හිනැහේ තරු මල්
- තරුමල් හිනැහේ සතුටින්

ඉහත දැක්වෙන නිදසුන් ආදර්ශයට ගෙන පහත වැකි ඉන් එක් ආකාරයකට පද මාරු කර ලියන්න.

i. පියුම් පිපේ විල් තෙරේ -.................................................................................
ii. මොනරු රඟති පිල් විදා -.................................................................................
iii. බඹරු රඟති ගුම් දී දී -.................................................................................
iv. සියොත් රාව ඒවී නැඟී - .................................................................................
v. පා සලඹේ රාව නැගේ -.................................................................................
vi. මල් මද පවනේ සැලේ -.................................................................................
vii. ගඟ ගලා යයි සෙමෙන් -.................................................................................
viii. කුකුළා හිමිදිරියේ හඬල යි. -.................................................................................
ix. පා වෙලා කළු වලා - .................................................................................
x. පෙණ කැටි විසිරේ ඇල්ලේ - .................................................................................

(ලකුණු 10 යි)

02. ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ජීවන අත්දැකීමක් ඇසුරෙන් අප සිතෙහි පහළවන ප්‍රබල හැඟීමක් අන් අයගේ ද සිත සසල වන සේ ප්‍රකාශ කිරීමට යොදා ගන්නා එක් මගකි , කවිය.
කවියෙන් පළ කරන අත්දැකීම තව කෙනෙකුගේ සිතෙහි හට ගන්වන්නේ පෙර නුදුටු නොඇසූ විරූ හැඟීමකි. මෙම අපූර්වත්වය චමත්කාරය ලෙස ද හඳුන්වයි. මේ නිසා කවිය කියවන හෝ අසන හෝ තැනැත්තාගේ සිතෙහි දැඩි සතුටක් හෙවත් ප්‍රහර්ෂයක් හට ගනී . පැරණි පඬිවරු මෙය “ රසය ” යැයි හැඳින්වූහ. එබැවින් “ කවිය “ රසවත් වූ වැකිය යි.
කවි රස විඳීමට හුරුවක් හෝ පුරුද්දක් තිබිය යුතු ය. කාව්‍යසාහිත්‍යාදී කලා , රස විඳීමෙන් සුමට වූ හදක් ඇත්තෝ සහෘදයෝ වෙති.

(1) කාව්‍යයක් නිර්මාණය වන්නේ කුමක් ඇසුරෙන් ද?
........................................................................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(2) අපූර්වත්වය හෙවත් චමත්කාරය යනු කුමක් ද?

.................................................................................................................................

(3) ප්‍රහර්ෂය යනු කුමක් ද ?

.................................................................................................................................

(4) පැරණි පඬිවරුන්ට අනුව කවිය යනු කුමක් ද?

.................................................................................................................................

(5) සහෘදයෝ යනු කවරහු ද ?

.................................................................................................................................

( ලකුණු 2 X 5 = 10)

03. පහත ඇති පැදි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පෙරදිග අහසින් දිනිඳු වඩින විට
මනාලියක ලෙස සැරසෙයි තුරු වැට
කොවුල් නාද දෙයි ගී රස මිහිරට
මඟුල් ගෙයක සිරි අසිරි දැනෙයි මට

හිරු රැස් වැටිලා පීදුණු ගොයමට
රන්වන් පාටින් දිස් වෙයි ඈතට
රන් හිරු රැස් වැටිලා මහ පොළොවට
සෙමෙන් පලා යයි තණ අග පිනි කැට

i. මෙම පැදි පෙළෙන් කියවෙන්නේ කුමක් ගැන ද?.........................................................................

ii. පැදි පෙළෙහි අඩංගු උපමාවක් තෝරා ලියන්න? ...........................................................................

iii. පැදි පෙළෙහි අඩංගු එළිසමය යෙදෙන අවස්ථා දෙකක් තෝරා ලියන්න.

.................................................................................................................................

iv. පෙරදිග හා දිනිඳු යන පදවල තේරුම ලියන්න.

.................................................................. ..................................................................

v. 'සෙමෙන් පලා යයි තණ අග පිනිකැට' යන පදයේ අර්ථය ලියන්න.

.................................................................................................................................

( ලකුණු 10 යි)

04. මාත්‍රා සංඛ්‍යාව ගැන සැලකිලිමත් වෙමින් පද පූරණය කරන්න

උඩ අත්තේ අඹ ගසේ
ටිං ටිං සද්දය ඇසේ
.........................................................
.........................................................

සරුංගලේ රැලි සලා
යයි අහසට පා වෙලා
.........................................................
.........................................................

( ලකුණු 10 යි)

05. දී ඇති කවි පැනවලට ආදාළ විරිතෙන් ම පිළිතුරු ලියන්න.

වෙල මැද්දේ හිට ගන්නේ
කකුලක් උස්සා ගන්නේ
ඩිංගක් නෑ හෙල්ලෙන්නේ
කොකා මොකද සිල් ගන්නේ

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සුළඟට එහෙ මෙහෙ පැද්දේ
ඩිංගක්වත් නෑ සද්දේ
සිනාව මුව්ටිය මැද්දේ
පඹයා ඇයි වෙල මැද්දේ


හෝ ගා වැස්සක් වැටුණේ
මිදුල ම වතුරෙන් පිරුණේ
ඒකයි මිදුලට පැන්නේ
අම්මා ඇයි මට බැන්නේ

වෙනදට මගේ මල් වත්තේ
වහලා පිපි මල් මත්තේ
හරි සතුටෙන් රොන් ගත්තේ
ඇයි අද සමනලු නැත්තේ

මිදුලේ අඹ ගහ මැද්දේ
ඇහුණා ටිං ටිං සද්දේ
කුඩුව එහෙ මෙහෙ පැද්දේ
ඇයි මල්ලියේ ගල් විද්දේ

( ලකුණු 10 යි)

06. පහත දැක්වෙන පින්තූරය හොඳින් නිරීක්ෂණය කර ඔබේ සිතේ මැවෙන සංකල්ප ඇසුරෙන් කැමති විරිතක් අනුව පදා 08 කට නො අඩු වන සේ පැදිපෙළක් නිර්මාණය කරන්න. සුදුසු මාතෘකාවක් යොදන්න.



( ලකුණු 10 යි)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**11 කොටස**

පහත දැක්වෙන (අ) කොටසින් එක් කොටසක් හෝ (ආ) කොටසේ කොටස් දෙකෙන් එක් කොටසක් හෝ තෝරාගෙන පද්‍ය 08 කට නො අඩු පද්‍ය රචනාවක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

01. (අ) i
මහ පොළව ඉරි තලා
වැව් පතුල මතු වෙලා
ගහකොළ ද වියළිලා
අපේ හද මැළවිලා

ii
එරබදු ගස් රතු වෙලා
කජු ගස් මල් බර වෙලා
කොහෝ නාද මතු වෙලා
අම්මට වැඩ වැඩි වෙලා

iii
සරුංගලේ නූල අරන්
වැල්ල දිගේ දුවනවා
හෝ ගාගෙන වැල්ල ඇවිත්
අපේ අඳුම් තෙමෙනවා

iv
දන්සැල් දෙන්නේ
තොරණ බඳින්නේ
හැමෝම බැතියෙන්
පන්සල් යන්නෙ

(ආ) i උදෑසන රැස්වීමේ දී ඔබට වැඩිහිටියන් ට සැලකීම පිළිබඳව කතාවක් කිරීමට සිදු වුයේ යැයි සිතන්න. එම කතාව කවියෙන් ඉදිරිපත් කිරීමට සුදුසු කවි පන්තියක් නිර්මාණය කරන්න.

ii 'මම ගහක් වෙමි' යන තේමාව යටතේ කවි පන්තියක් නිර්මාණය කරන්න.

( ලකුණු 50 යි)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය 2023**
**කලාප මට්ටම**
**පද්‍ය නිර්මාණය හා අවබෝධය**

**09 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

- ❖ අපේක්ෂකයාගේ නම :- ........................................................................................................
- ❖ විදුහලේ නම සහ ලිපිනය:-.....................................................................................................
- ❖ කලාපය:- ..............................................................................................................................
- ❖ පාසල් වර්ගය:-200 තෙක්/ 201 සිට 500/ 500 ට වැඩි.

- ➢ පළමුවන කොටසට අයත් සියලු ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.
- ➢ 11 කොටසේ (අ) , (ආ) කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු ලියන්න.
- ➢ පිළිතුරු ලිවීම සඳහා ලියන කඩදාසි භාවිත කරන්න

1 කොටස

01. පහත දැක්වෙන උපමාලංකාර යෙදුම් රූපකාලංකාර බවට හරවන්න.
උදා :- සඳක් වැනි වත - සඳවත

ගලක් වැනි හිත - ..........................................................................
පියුම් වැනි පා - ..........................................................................
විලක් වැනි හද - ..........................................................................
අහස වැනි සිත - ..........................................................................
මල් වැනි හිනාව - ..........................................................................
කතරක් වැනි සසර - ..........................................................................
මිණි වැනි පහන - ..........................................................................
පිනි වැනි කඳුළු - ..........................................................................
පියුම් වැනි නෙත් - ..........................................................................
මල් වැනි හැඟුම් - ..........................................................................

( ලකුණු 10 යි)

02. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

සාහිත්‍යකරුවා භාෂාවේ ශබ්ද , පද, වාක්‍යය ආදිය උපයෝගී කොට ගෙන දෙයාකාරයක රසයක් නිපදව යි.එකක් ශබ්ද රසය යි.දෙවැන්න අර්ථ රසය යි.අර්ථ රසයෙන් ද ශබ්ද රසයෙන් ද පරිපූර්ණ වාක්‍ය රසාත්මක වාක්‍යයක් හෙවත් කාව්‍යයක් වේ.

කවියා ශබ්ද රසය ඇති කරන්නේ පොදු ජනයා භාෂාව භාවිත කරනවාට වඩා වෙනස් ආකාරයකින් භාෂාවේ ශබ්ද යෙදීමෙනි.මේ අරමුණෙන් ඔහු කරන එක් දෙයක් නම් සමාන ශබ්ද ඇති පද එක්තරා රටාවකට ගැළපීම යි.එය අනුප්‍රාසය ලෙස හඳුන්වයි.එසේ ම රසවත් වචන සොයාගෙන භාවිත කිරීමට ද කවියා යොමු වෙයි.ශබ්ද රසයෙන් අසන්නාගේ කන පිනා යයි. එහෙත් සැබෑ රසයක් උපදින්නේ අර්ථ රසයෙනි .අර්ථ රසය උපදින්නේ අලංකාර කියුම් අනුසාරයෙනි. මෙබඳු කියුම් හැඳින්වෙන්නේ කාව්‍යෝක්ති යනුවෙනි.

(i) සාහිත්‍යකරුවා රස නිපදවීමට උපයෝගී කර ගත්තේ මොනවා ද?...................................................
(ii) රසාත්මක වාක්‍යයක් හෙවත් කාව්‍යයක් වන්නේ කුමක් ද?
.............................................................................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(iii) අනුප්‍රාසය යනු කුමක් ද?

.....................................................................................................................................

(iv) කවියක් සැබෑ රස උපදින්නේ කුමක් නිසා ද?

.....................................................................................................................................

(v) කාව්‍යෝක්තියක් යනු කුමක් ද?

.....................................................................................................................................

( ලකුණු 10 යි)

03. පද පූර්ණය කොට ලියන්න.

(I) මිතුදම් සුරකිමු
එකමුතු වී ඉමු
..............................................
..............................................

(II) ගහ කොළ කපන්නේ
වන පෙත නසා ගන්නේ
.....................................................
.....................................................

(III) රෑ අහසේ රටා මවන
තරු දරුවෙනි මේ අහන්න
............................................................
............................................................

(IV) කුඹුක් ගසේ උඩ අත්තේ
කැදලි හදනු හොඳ නැත්තේ
............................................................
............................................................

(V) .................................................................
.................................................................
හදාගත්තු පැල ඇතුළේ තුටින් සිටින්න
අලි මිතුරෝ එපා අපේ ගමට වඩින්න

( ලකුණු 10 යි)

04. පහත සඳහන් කවි පැනවලට අදාළ විරිතෙන් ම පිළිතුරු ලියන්න.

(I) වැවේ පැනලා නාන්න
ඔට්ටු තියලා දුවන්න
පොඩ්ඩක් දූව පනින්න
ඉඩ දෙනව ද කියන්න

(II) සොසේජ් බැදලා අල පෙති බැදලා
රයිස් ගෙනාවා අද මිරිලා
ඒවා දැක්කම මට හරි ආසයි
දෙනව ද අම්මේ මට හදලා

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(III) ගොඩක් කාලෙකින් ඔබ ආවේ නෑ
මල් පැණි බොන්නට මගේ වත්තේ
නෑයන් සමගින් ගියා ද පියඹා
වඳින්න සමනල ගල පැත්තේ

(IV) ඈත කන්දකින් බැස එන්නේ
ටිකටික කඳ බඩ ලොකු වන්නේ
නිතර ම ගමනේ ඔබ ඉන්නේ
ගංගාවේ කොහෙදෝ යන්නේ

(V) අවුරුදු කාලෙට ඔබ ඉන්නේ
නළාව පිඹ පිඹ ඉගිලෙන්නේ
දැන් අඬගැහුවත් නෑ එන්නේ
කොවුලෝ කොහේ ද හැංගෙන්නේ

( ලකුණු 10 යි)

05. පහත දැක්වෙන පින්තූරය හොඳින් නිරීක්ෂණය කර ඔබේ සිතේ මැවෙන සංකල්ප ඇසුරෙන් කැමති විරිතක් අනුව සිවුපද ආකෘතියට අනුව පදා අටකට නො අඩු පැදිපෙළක් නිර්මාණය කරන්න. සුදුසු මාතෘකාවක් යොදන්න.



( ලකුණු 10 යි)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**11 කොටස**

පහත දැක්වෙන (අ) කොටසින් එක් කොටසක් හෝ (ආ) කොටසේ කොටස් දෙකෙන් එක් කොටසක් හෝ තෝරාගෙන පද්‍ය 08 කට නො අඩු පද්‍ය රචනාවක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න

(අ)

(I) පන්සල් පල්ලි කෝවිල් අපි ගියාට
ආගම දහම කට පාඩම් කළාට
ලකුණු අරන් පළවෙනියා වුණාට
දෑ කුල භේද තවමත් ඇත හිතේ යට

(II) යන යන තැන තැන කුණු නොදමන්නේ
දුටු දුටු තැන ඇති කුණු අහුලන්නේ
රැළි රැළි දිය පොද ඉවත හලන්නේ
ඩෙංගු මදුරුවට එන්න නොදෙන්නේ

(III) යන අය එනතුරු සිත බිය වන්නේ
මහමඟ 'මහමරු ' රියසක වන්නේ
නීති රීති නිසි ලෙස පිළි ගන්නේ
මහමඟ අනතුරු වළකා ගන්නේ

(IV) නිල්ල ගසා කෙත් යාය ම රුවට දිලෙනවා
වැවේ ඉදන් නිල් දිය කඳ ඇළේ ගලනවා
වක්කඩ ළඟ කොක් රැනක් තපස් රකිනවා
ගොවි රජිඳා සතුටු සිතින් කුඹුරට එනවා

(V) රන්වන් රන් වලා කැරලි පාවී යනවා
නිල් තරු කැට දිළිසි දිළිසි මුකුළු කරනවා
සේපාලික ගහ ටික ටික සුදු පැහැ වෙනවා
හඳ මාමා වලා මැදින් එබී බලනවා

(ආ) I "මහා වැස්සක තෙමුණු දිනක් " යන තේමාව යටතේ පද්‍ය පන්තියක් නිර්මාණය කරන්න.

II ඔබ ගිය විනෝද චාරිකාවක දී ඔබ ලද අත්දැකීම් සහ චමත්කාරය ඇසුරෙන් පද්‍ය පන්තියක් නිර්මාණය කරන්න.

( ලකුණු 50 යි)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය 2023**
**කලාප මට්ටම**
**පද්‍ය නිර්මාණය හා අවබෝධය**

**10 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

- අපේක්ෂකයාගේ නම :- ..........................................................................................
- විදුහලේ නම සහ ලිපිනය:-..........................................................................................
- කලාපය:- ..........................................................................................
- පාසල් වර්ගය:-200 තෙක්/ 201 සිට 500/ 500 ට වැඩි.

- **පළමුවන කොටසට අයත් සියලු ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**
- **11 කොටසේ (අ) , (ආ) කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු ලියන්න.**
- **පිළිතුරු ලිවීම සඳහා ලියන කඩදාසි භාවිත කරන්න**

**1 කොටස**

**01.** **පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(අ) රසවත් වාක්‍යය නිවැරදි ව ගළපා අපට පද්‍ය හෝ ගද්‍ය නිර්මාණ කළ හැකි ය.ශරීරය සරසන සළුපිළි අබරණ මෙන් කිසියම් පද්‍යයක හෝ ගද්‍යයක රස උද්දීපනය සඳහා භාවිත කරන යෙදුම්වලට අලංකාර යැයි කියනු ලැබේ. එවැනි අලංකාර විධි අතරින් වඩාත් බහුල ලෙස යොදා ගැනෙන්නේ උපමාලංකාරය යි. උපමාලංකාරය යනු කිසියම් වස්තුවක් වර්ණනා කිරීමේ දි වෙනත් ප්‍රකට වස්තුවක් හා සමාන කොට දැක්වීම යි. වස්තු දෙක අතර ඇති සාමානත්වය සර්වප්‍රකාරයෙන් ම සිදු විය යුතු දෙයක් නොවුවත් එහි සමාන බව එක දෙයකින් වුව ද දැක්වීම ප්‍රමාණවත් ය.එහි දී සිදු කෙරෙන ප්‍රධාන ම කාර්යය නම් උපමාවක මෙන් , සේ . වැනි , සදිසි , බඳු . වගේ වැනි පද යොදා උපමා උපමේය ගළපා ලිවීම යි. මේ ඊට නිදර්ශකයකි.

මගේ සුරතල් අක්කාගේ

මාලේ මුතු ඇට වාගේ

මේ වැටෙන්නේ පිනි බින්දු යි

හදමු එකක් ඒ වාගේ

I. පද්‍ය නිර්මාණයේ දී අලංකාර යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද? ..................................................
..........................................................................................
II. සාහිත්‍ය නිර්මාණවල දී බහුල ව යොදා ගන්නා අලංකාර විධිය කුමක් ද? ......................................
..........................................................................................
III. කවියෙහි “පිනි බින්දු” උපමා කර ඇත්තේ මොනවාට ද? ..................................................
..........................................................................................

(ලකුණු 03)

(ආ) දැනට පවතින පැරණි සිංහල කවි පොත් අතරින් වැඩිපුර දැකිය හැක්කේ නියම සිංහල කාව්‍ය තත්ත්වය නොවේ. ඒවායේ ඇත්තේ අනුගමනයට කළ උත්සාහයකි. අසක්දා කව, පුරාණ මයුර සංදේශය ආදී කාව්‍ය ග්‍රන්ථ තිබී පසුව අභාවයට ගිය බවක් පැරණි සිදත් සඟරා සන්නයෙන් පෙනේ. එදා නැති වූ දස දහස් ගණනින් කිහිපයක් බව පෙනේ. සිංහල අටුවාවෙන් පුරාණ සිංහල කාව්‍ය ග්‍රන්ථ ද සිංහලය ද සිංහලයා ද අතහැර පැනගිය අයුරු අභාවයට පත් වූ අයුරු පෙනී යත් ම ඇති වන්නේ බලවත් සංවේගයකි.

(i) අභාවයට පත් පැරණි කවි පොත් දෙකක් නම් කරන්න.
(ii) ..........................................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(iii) දැනට පවතින පැරණි කවි පොත්වලින් දැකිය හැක්කේ කෙබඳු උත්සාහයක සලකුණු ද?
(iv) බලවත් සංවේගයක් ඇති වන්නේ ඇයි?

(ලකුණු 03)

(ඇ) සාහිත්‍ය නිර්මාණ අතරින් කවිය හෙවත් කාව්‍යයට විශේෂ ස්ථානයක් හිමි වේ. රමණීය අදහස් හා අරුත් දැන වෙන පරිදි කරන භාෂාමය නිර්මාණය කාව්‍යය යි. කවි නිර්මාණය කරන්නේ කවියා ය. කවියෙකු බිහිවීමට හේතු තුනක් බලපාන බව පෙරදිග විචාරකයෝ අදහස් කරති . එනම් ප්‍රතිභාව ව්‍යුත්පත්තිය හා සතතාභ්‍යාසය යි. ප්‍රතිභාව යනු තමා විඳින අත් දැකීම් ඇසුරෙන් අපූර්ව සිතිවිලි පහළ කර ගැනීමේ හැකියාව යි. ව්‍යුත්පත්තිය යනු කාව්‍ය නිර්මාණය මෙන් ම විවිධ ශාස්ත්‍ර හා විෂය සම්බන්ධ පරිණත අවබෝධය යි. සතතාභ්‍යාසය යනු නිර්මාණකරණයෙහි නිරන්තර ව යෙදෙමින් ලබා ගන්නා ප්‍රාගුණ්‍යය යි.

i. කාව්‍යය යනු කුමක් ද?

ii. කවියා යනු කවරෙක් ද ?

iii. පෙරදිග විචාරකයන් කවියෙකු බිහිවීමට හේතු කීයක් දක්වා තිබේ ද?

iv. ඔවුන් දක්වන හේතුන් කෙටියෙන් හඳුන්වන්න.

(ලකුණු 04 යි)

(2) පද පූරණය කොට ලියන්න.

(i) දිවි මඟ යහපත් කරවන
සවියකි හදවත් සනහන
ගුණවත් ........................................................
මව්පිය සැලකුම .............................................

(ii) කඩමින් පොල් ගසක ගෙඩි නැඟ ගස උඩට
දරුවන් ගැන සිතන ............................... හදවතට
සදමින් සැනසුමක් ඉගෙනුම .....................................
නුඹවන් ......................................... මව් බිමට

(iii) බුදුන් දහම් සඟ ගුණ
උතුම් විලස දැන .......................................
................................................................
................................................................

(iv) හෙට ලෝකය දිනන පුතා
.........................................................................
යහගුණ දම් කරුණු සිතා
..............................................................................

(v) නිවසක සතුට සහයෝගය පැවතීම
කළහැක වාසනාවේ ජය ගෙනදීම
.........................................................................
අහසක තරු වගෙයි රටට ම බැබලීම

(ලකුණු 10 යි)

(3) පහත දැක්වෙන කවි පැනවලට පිළිතුරු සපයන්න.

(i) ඉර දැක ගෙවත්තේ පොඩි මල් හිනැහෙන්නේ
අර සමනල් රෑන කොහෙට ද ඉඟිලෙන්නේ

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(ii) පාසල් ගොස් දැනුම දිනා
වෙන්නේ කවුරු කියනු මැනා

(iii) හැරමිටියකට වාරුව දී පාරේ යන
වැඩිහිටියෙකුට සලකනව ද කියනු මැන

(iv) පාඩම් වැඩක අක්ක යි අයිය යි ඉද්දී
නාඩන් කියද්දිත් ඇඩුව ද හිත රිද්දී ?

(v) දින සටහනේ ඉගෙනුමට යොදන සිත
දුරකතනයෙන් දැනුමක් ලබනව ද පුත

(ලකුණු 10 යි)

04. පහත දැක්වෙන රූපක උපමාලංකාර බවට හරවන්න.

| රූපක | උපමා |
|---|---|
| 1.සඳවත | |
| 2.ගුවන්තල සිරියහන | |
| 3.නිසයුරු හිමි | |
| 4 තරු මල් | |
| 5. කිරි දත් | |
| 6.රූකඩ මුහුණ | |

(ලකුණු 6 යි)

(5) පහත දැක්වෙන පද්‍යයෙහි එක් එක් මාත්‍රා සංඛ්‍යාව වරහන් තුළ ලියන්න.

මාත්‍රා

1. වලාකුළෙහි රන් පාටට විදුලි කොටනවා ........................
2.ආකාසේ හඬ තළමින් අකුණු හඬනවා ........................
3.බිංදු බිංදු මහ පොළොවට වතුර වැටෙනවා ........................
4. හෝ ගාමින් සුළඟ හමා වැස්ස වහිනවා ........................

(ලකුණු 4යි)

(6) පහත දැක්වෙන චිත්‍රය මැනවින් නිරීක්ෂණය කර ඔබේ සිතෙහි හට ගන්නා කාව්‍යාම ය සංකල්ප පද්‍ය 10කින් පමණ නිර්මාණය කරන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(ලකුණු 10)

11 කොටස

I පහත දැක්වෙන (අ) කොටසින් හෝ (ආ) කොටසින් එක් මාතෘකාවක් තෝරා ගෙන පද්‍ය 10කට නොඅඩු පද්‍ය නිර්මාණයක් කරන්න.සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(i) ඉටු කොට කළ යුතු යුතුකම්
ලැබුණත් ලෝකෙන් ගැරහුම්
ඉවසන්නට පුළුවන් නම්
නුඹයි මගේ පුතා උතුම්

(ii) අතට වෙරළු ඇහිඳ ගෙනේ
බරට ම දර කඩා ගෙනේ
ඉණට පලා නෙළා ගෙනේ
එයි අම්මා විගසකිනේ

(iii) රැගත් සුරා පිරූ විතින්
සුරත් තඹරු පෙති සෙනෙතින්
පුවත් නොදැන බමන ගතින්
නටත් අයෙක් සුරා මතින්

(iv) මුනි සිරිපා සිඹිමින්නේ - සමනොළ ගිරි සිරසින්නේ
මද සුළඟයි මේ එන්නේ - මගේ පුතා නිදියන්නේ

(v) ගස වතු සුදු
වී පිරිසිදු
පොහොය නැතිදු
සිල්ගත් බඳු

(ආ) (i) දවසේ මෙහෙවර නිමා කර හිරු අවරට යනවිට නිවසට පැමිණි තාත්තා හෝ අම්මාට ආදරණීය දරුවෙකු ලෙස ඔබ කරන කතාව කවියෙන් ලියන්න.(පද්‍ය 10කට නොඅඩු විය යුතු ය)

නැතහොත්

(ii) ඔබ පාසලේ ශිෂ්‍ය නායක පදක්කම් පළඳවන උත්සවයේ දී ඔබට කවියෙන් තකාවක් කරන්නට අවස්ථාවක් ලැබී ඇත. එම කවි කතාව පද්‍ය 10කට නො අඩුව ලියන්න.

(ලකුණු 50)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය 2023**

**කලාප මට්ටම**

**පද්‍ය නිර්මාණ හා අවබෝධය**

**11 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

❖ අපේක්ෂකයාගේ නම :- ..............................................................................................

❖ විදුහලේ නම සහ ලිපිනය:-.......................................................................................................

❖ කලාපය:- ......................................................................................................................

❖ පාසල් වර්ගය:-200 තෙක්/ 201 සිට 500/ 500 ට වැඩි.

- **පළමුවන කොටසට අයත් සියලු ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**
- **11 කොටසේ (අ) , (ආ) කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු ලියන්න.**
- **පිළිතුරු ලිවීම සඳහා ලියන කඩදාසි භාවිත කරන්න**

**1 කොටස**

01. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

නිර්මාණකරුවා විවිධ ආකාරයේ අත්දැකීම් පාදක කර ගනු දක්නට ලැබේ. කිසියම් අවස්ථාවක් , සිදුවීමක් , විචාර චින්තාවක් , කතා ප්‍රවෘත්තියක් , සුන්දර සංකල්පයක් හෝ අද්භූත සංකල්පයක් , සමාජ විෂමතාවයක් , සමාජ අසාධාරණයක් දේශපාලන ගැටලුවක් පවුල් අර්බුදයක් ආදී විවිධ තේමා යොදා ගනු දක්නට ලැබේ.

කුමන අත්දැකීමක් තෝරා ගත්ත ද එහි අපූර්වත්වයක් හෙවත් නවතාවයක් ද අර්ථාචින්තභාවයක් ද තිබිය යුතුය. රචකයා තෝරා ගත් අත්දැකීමෙහි වැදගත් හා එයින් සමාජයට සිදුවන මෙහෙවර කොතෙක් ද යන්න විචාරතයාගේ විමසුමට ලක්විය යුතුය. නිර්මාණයේ සාර්ථකත්වය සඳහා රචකයා යොදා ගත් උපක්‍රම කෙරෙහි ද අවධානය යොමු කළ යුතු ය.
භාෂාව ,සංකල්ප රූප, විරිත හෝ රිද්මය,සම්ප්‍රදාය ඒ අතර ප්‍රධාන වේ. භාෂාව යනු නිර්මාණකරුවාගේ සාහිත්‍ය මෙවලම යි. මිනිස් සිතේ හට ගන්නා අදහස් හා හැඟීම් ප්‍රකාශ කරන උපකරණය භාෂාවයි. විද්‍යාඥයා පරිහරණය කරන භාෂාව නිශ්චිතාර්ථ දැනවුව ද සාහිත්‍යකරුවා ධ්වනි පූර්ණ බස්වහරක් භාවිත කරයි. මේ අනුව සාහිත්‍යකරුවා යොදා ගන්නා භාෂාවේ විශේෂ ලක්ෂණය හැඟීම් දැනවීමේ ශක්තිය යි.භාෂාවක හැඟීම් දැනවිමෙ ශක්තිය ‘‘භාවික ගුණය’’ ලෙස හඳුන්වයි .

I නිර්මාණකරුවා තෝරා ගන්නා අත්දැකීම් තුනක් තෝරා ලියන්න.

.........................................................................................................

II නිර්මාණකරුවා යොදා ගන්නා අත්දැකීම් පිළිබඳ විචාරකයා සලකා බලන කරුණු මොනවා ද ?

.........................................................................................................

III නිර්මාණයක සාර්ථකත්වය උදෙසා භවිත උපක්‍රම කවරේ ද?..........................................

.........................................................................................................

IV නිර්මාණකරුවාගේ සාහිත්‍යමය මෙවලම කුමක් ද?

.........................................................................................................

V භාවික ගුණය යනු කුමක්ද?

.........................................................................................................

(ලකුණු 2x5=10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

02. පද පූරණය කොට ලියන්න. දී ඇති කාව්‍ය රීතියට අනුවම පද නිර්මාණය කළ යුතුය.

(i) පායා සිනාසෙයි හිරුමල නැගෙන හිරින්
පිනි බිඳු පලා යයි නිල් තණ පලස මතින් .
..............................................................................
..............................................................................

(ii) හිරු නිදියයි - මල් හැකිලෙයි
සඳ හිනැහෙයි - තරු ඇහැරෙයි
..............................................................................
..............................................................................

(iii) රැල්ල නැගෙනවා
වැල්ලෙ හැපෙනවා
..............................................................
. ..............................................................

(iv) ජීවිතේ මහ බරක්
ඈ හිසේ දරාගෙන
හිරුට පෙර අවදි වී
..................................................................

(v) පොවා සිප් කිරි
අපට දී සවි
..............................................................
..............................................................

(ලකුණු 2x5=10)

(2) පහත කවි පැනවලට අදාළ විරිතෙන් ම පිළිතුරු කවි ලියන්න.

i . ඩොලරය ඉහළට යන්නේ
රුපියල දැන් පා වෙන්නේ
බඩු මිළ ඉගිලී යන්නේ
කොහොම ද ජීවත් වන්නේ

ii. එල්ලන් පොත් මල්ල ගල් ගෙඩියක් වාගේ
බිමට නැමී ගෙන සිතුවිලි නෑ වාගේ
ඇදී ඇදී යයි ගොළු බෙල්ලන් වාගේ
කියන්නේ කොහොම පොඩි අය මල් වාගේ

Iii මත් රකුසා මිතුරු වෙසින්
ඇවිදින් පාසල් අසලින්
නැවතීලා හොරෙන් හොරෙන්
දුටුව ද අර ඉන්නේ බලන්

iv ලඳු කැලේ ඇවිදලා
ගඩාගෙඩි රස බැලුව
වැවට පැන පීනලා
වරු ගණන් දිය නැව

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

v ළමා කල රස කතා
පැය ගණන් මට කීව
තාත්තේ අද මොක ද
ඉන්නෙ බිම බලාගෙන

(ලකුණු 2x5=10)

04.පහත දැක්වෙන පදවලට ගුරු ලඝු සංකේත යොදන්න.

(අ)

| වචනය | ගුරු - ලඝු සංකේතය |
|---|---|
| උදා :- මලානික | _ ◡ _ _ |
| i. අසරණ | |
| ii. අවාසිය | |
| iii. අපචාර | |
| Iv. ආරාධනා | |
| v. ආලාරකාලාම | |

(ලකුණු = 5)

(ආ) i. මිණිපහන - ......................................................

ii. රන්විමන - ......................................................

iii. වතකමල - ......................................................

iv. නෙත්පියුම් - ......................................................

v හදවිල - ......................................................

(ලකුණු = 5)

05. මේ පද්‍යයන්හි යොදා ඇති උපමා උපමේය වෙන් කොට දක්වන්න

(i) රන් බඳනෙහි කෙසර - තෙල් අඩු කොවී පවතින මෙන්
උතුමන් හද සපිරි - කුලුණු මෙත් අඩු නොවී පවතියි

(ii) අමරසවන් අඹ රස බුදිමින් සිනිඳු
නිතී ගෙ උයන් පෙදෙසෙහි සරමින් පසිඳු
එක පැහැයෙන් ඉදිකත් කොවුලනට බඳු
නද පමණින් දැන ගත හැකි රිටුන් ඉඳු

(ලකුණු = 6)

06. පහත දැක්වෙන චිත්‍රය මැනෙවින් නිරීක්ෂණය කොට කැමති විරිතක් අනුව පද්‍ය අටකට නො අඩු පැදි පෙළක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



(ලකුණු = 10)

**11 කොටස**

**පහත දැක්වෙන (අ) කොටසින් එකක් හෝ (ආ) කොටසින් එකක් හෝ තෝරාගෙන පද්‍ය 10 කට නො අඩු පද්‍ය රචනාවක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.**

(අ)

i. ඉර හඳවාගේ අපේ ලෝකයට
අම්ම තාත්තා ළඟ ඉන්නේ
මහ බලයක් වී පහන් වැටක් වී
අපෙ ජීවිතයට සවි දෙන්නේ (මාතෘකාව- මව්පිය ගුණ)

ii පොත් මිතුරෝ ඇත රාක්ක ඇතුළේ
පුස්තකාලයට අපි යනවා
දැනුම සොයා ගෙන වචනෙන් වචනෙට
පිටු අතරින් ගමනක් යනවා (මාතෘකාව- පොත් අපේ මිතුරෝ)

iii. වැව යි දාගැබ යි ගමයි පන්සලයි
නිල් පාටින් සැදි කෙත් යායයි
එළවළු පලතුරු කොටු හරි සාරයි
අපෙ ගම නිබඳ ව සිරියාවයි (මාතෘකාව- අපේ ගම)

iv තුරු වදුලේ වන වදුලේ
මද සුළඟේ මල් හිනැහේ
ගුමු ගුමුවේ හඬ තැවරේ
මී වදවල පැණි ඉතිරේ (මාතෘකාව - සුන්දර වනය)

(ආ) (I) නේවාසික ව අධ්‍යාපනය ලබන ඔබ පළමු වතාවට නිවසින් ඈත් වී ගොස් නේවාසික ව අධ්‍යාපනය ලබන්නේ යැයි සිතන්න. නිවසින් පිටත් ව නේවාසිකාගාරයේ නැවතුණු පළමු දිනයේ ඔබට දැනුණු හැඟීම් කවියට නගන්න. (සඳැස් හෝ නිසඳැස් පද්‍ය 10කට නො අඩු විය යුතුය)

නැතහොත්

(II) ඔබ පළමු වතාවට සිරිපා වන්දනාවේ ගොස් ඉර සේවය නැරඹුවේ යැයි සිතන්න. එම චාරිකාව පිළිබඳ ඔබේ සිතේ ඇති වූ චමත්කාරය කවියට නගන්න. (පද්‍ය 10කට නොඅඩු විය යුතුය )

(ලකුණු 50)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය 2023**
**කලාප මට්ටම**
**පද්‍ය නිර්මාණය හා අවබෝධය**

**12/13 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

- ❖ අපේක්ෂකයාගේ නම :- ..............................................................................................
- ❖ විද්‍යාලයේ නම සහ ලිපිනය:-.........................................................................................
- ❖ කලාපය:- ..........................................................................................................
- ❖ පාසල් වර්ගය:-200 තෙක්/ 201 සිට 500/ 500 ට වැඩි.

- ➢ පළමුවන කොටසට අයත් සියලු ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.
- ➢ 11 කොටසේ (අ) , (ආ) කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු ලියන්න.
- ➢ පිළිතුරු ලිවීම සඳහා ලියන කඩදාසි භාවිත කරන්න.

1 කොටස

01. (අ) පහත දැක්වෙන ඡේද කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දැනට විද්‍යාමාන පැරණි ම සිංහල මහාකාව්‍ය කව්සිළුමිණ බැවින් , වාග් විද්‍යාවට ද සාහිත්‍යයට ද කව් සිළුමිණේ වටිනාකම අවිවාදයෙන් පිළිගැනුණකි.ග්‍රන්ථාවසානයෙහි එන පද්‍ය තුනෙන් ලැබෙන තොරතුරු අනුව මේ කාව්‍යයෙහි කර්තෘත්වය 1236 වැන්නෙහි රජ පැමිණි දඹදෙණියේ දෙවන පරාක්‍රමබාහු රජතුමන් වෙත පැවරි ඇත. එසේ වුවත් මෑත දි ඇතැම් ශාස්ත්‍රවේදීන් මේ ග්‍රන්ථය මෙයට වඩා පැරණි යුගයකට අයත් යයි තර්ක කොට ඇත.ග්‍රන්ථයේ භාෂා තත්වය හා රචනා මාර්ගය විමසීමේ දී එය අනුරාධපුර යුගයේ අපර භාගයට (10 වන සියවසට) අයත් ය යන හැඟීම කෙනෙකු තුළ ඇති වෙයි. මෙය දෙවන පරාක්‍රමබාහු රජු අතින් රචිත ය යන්න සැබෑ නම් , මේ කිවිසුරු මිහිපල්හු තම රචනයේ දී එකල පැවති, දැන් අභාවයට පත්ව ඇති සම්භාවනීය කාව්‍යයන් ළඟින් ම අනුකරණය කරන්නට ඇති බව සිතිය හැක.මේ කාව්‍යය ඉහත සිට අද දක්වාත් සිංහල ගුරු කුලයන්හි හදාරා ඇත. මෙය ඉහත කාලයේ දී කෙතරම් අගය කොට සලකන ලද ද යන්න, කෝට්ටේ යුගයට වඩා පැරණි වූ කාලයක දී පදගත සන්නයක් කිසිවකු විසින් ඊට සපයා ඇති බැවින් පැහැදිලි වේ.මේ සන්නය නිසා නොවේ නම් ,කාව්‍යයේ එන සමහර වචන හා යෙදුම් අද අපට දුරවබෝධ විය හැකිව තිබිණ. මෙම ග්‍රන්ථයේ අත්පිටපත් දුර්ලභ නොවන මුත් එතරම් පැරණි අවධිවලට අයත් වන්නේ නොවේ.

සන්න සහිත කව් සිළුමිණ 1899 තරම් ඈත දී ඒ අවධියේ වැජඹුණු සිංහල හා පාලි උගතුන් අතර ප්‍රමුඛස්ථානයක් දැරුවා වූ මඩුගල්ලේ සිද්ධාර්ථ ස්ථවිරයන් වහන්සේ විසින් පළමු වරට සංස්කරණය කොට ප්‍රසිද්ධ කරන ලදී.ශාස්ත්‍රීය පර්යේෂණවිධීන් පිළිබඳ ප්‍රචුර අවබෝධයක් නොතිබුණු එම අවධියේ දී, විවේචනෝපයෝගීභූත කරුණු ආදිය සැපයීමෙන් ද දර්ශනීය ලෙස ග්‍රන්ථය සකස් කිරීමෙන් ද මේ සංස්කාරකයා දැරූ පරිශ්‍රමය බෙහෙවින් ප්‍රශංසාර්හ වේ . එමෙන් ම, ග්‍රන්ථයේ භාෂා තත්වය සලකා බලන විට එය එකල සිංහල පඬිවරුනට පවා පහසුවෙන් අවබෝධ කර ගත හැකි ව තිබිණැයි සිතිය නොහැක.

- I දැනට විද්‍යාමාන පැරණි ම සිංහල මහා කාව්‍යය ලෙසින් සැලකුයේ කුමන සාහිත්‍ය කෘතිය ද?
- II ග්‍රන්ථයේ භාෂා තත්වය හා රචනා මාර්ගය විමසීමේ දී කව්සිළුමිණ කවර යුගයට අයත්යැයි අදහස් කළ හැකි ද?
- III මෙම කාව්‍ය හදාරා ඇති ගුරු කුලයක් නම් කරන්න.
- IV කාව්‍යයේ එන සමහර වචන හා යෙදුම් අපට දුරවබෝධ නොවීමට හේතුව කුමක් ද?
- V සන්න සහිත කව් සිළුමිණ පළමු වරට සංස්කරණය කොට ප්‍රසිද්ධ කරන ලද්දේ කවුරුන් විසින් ද?
- VI මෙම සන්න සහිත කව් සිළුමිණ සංස්කාරකයා දැරූ පරිශ්‍රමය වැදගත් වන්නේ කවර කරුණු නිසා ද?

(ලකුණු 06යි)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(ආ) සැකෙවින් මාත්‍රාවක් යනු වරක් ඇසිපිය හෙළන කාලය යැයි කියනු ලැබේ.උච්චාරණයේ දී එකිනෙකට වෙන් ව ශබ්ද වෙන අකුරු හෝ අකුරු සංයෝජන සඳහා ගතවන කාලය මාත්‍රා ගණනින් මනිනු ලැබේ.වෙන් ව ශබ්ද වන හල් අකුරක් එනම්, මළකුරක් මාත්‍රා බාගයක් ද,අ,ඇ,ඉ වැනි කෙටි ස්වර මාත්‍රා එකක් ද , හල් අකුරක් එවන් කෙටි ස්වරයක් හා බද්ධ ව සෑදෙන පණකුරක් මාත්‍රා එකහමාරක් ද , දිර්ඝ ස්වරයක් මාත්‍රා දෙකක් ද ආදි වශයෙන් වේ.එනමුදු මාත්‍රා ඡන්දස් සඳහා මත් ගණින කල මළකුරක් , කෙටි ස්වරයක් හා කෙටි ස්වර සහිත පණකුරක් මාත්‍රා එකක් ලෙස ගැනේ. දීර්ඝාක්ෂර මාත්‍රා දෙකක් ලෙස ගැනේ.එනම් මාත්‍රා ඡන්දසක මාත්‍රා නිශ්චය කරන්නේ,මත් එකේ හා මත් දෙකේ ශබ්ද ඒකක ලෙසිනි. වර්ණ වෙන් කර ගැනීමේ දී,කෙටි ස්වර සහිත පණකුරක් ලඝුවක් ලෙසින් ද,දීර්ඝාක්ෂරයක් ගුරුවක් ලෙසින් ද කිසියම් අක්ෂරයකට පසුව හල් අකුරක් වේ නම්,ඒ දෙක එකක් ලෙස ගෙන ගුරුවක් (හල්+ අන්ත - හලන්ත ගුරු) ලෙස සලකනු ලබයි.මාත්‍රා හා වර්ණ නිශ්චය කරනු ලබන්නේ,ලියන ආකාරය අනුව නොව,ශබ්ද වෙන ආකාරය අනුව ම පමණි.සංයෝගාක්ෂර සඳහා ද වචනය ශබ්ද වීම අනුව ම මාත්‍රා හා වර්ණ නිර්ණය කර ගත යුතු ය.පද්‍යයේ දී අකුරු ලෙස හැඳින්වෙන්නේ,ගුරු " U " හා ලඝු " - " වර්ණයන් ය.

I මාත්‍රා ගණනින් මනිනු ලබන්නේ,........................................................................ කාලය වේ.

II මාත්‍රා ඡන්දස් සඳහා මත් ගණන් කරන්නේ කෙසේ ද?

.....................................................................................................................................

.....................................................................................................................................

III මාත්‍රා දෙකක් ලෙස ........................................................................ ගණන් කරනු ලැබේ.

IV මාත්‍රා ඡන්දස මාත්‍රා නිශ්චය කරන්නේ කෙසේ ද?

.....................................................................................................................................

.....................................................................................................................................

v. හලන්ත ගුරු යන්න පැහැදිලි කර ඒ සඳහා උදාහරණ දෙකක් ලියන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

02. පහත පැදි පෙළ පිළිබඳ ඇගයීමක් කරන්න.

I
ගන්තුන තුලානේ අලියා වැටුණු වැවේ
සුන්දර හාමි එතරම් පොහොසතෙකු නොවේ
තුන්ලාහක ම බිම වැඩකර දියෙන් වැවේ
රන්වන් කරල් බර වී දැන් බිමට වැටේ

II
ඔහුගේ ගමට මා ගිය ඒ පළමු වර
තවමත් සිතේ ඇත අමතක නොවන යුර
හේනට ගොසින් ගෙන් හුවක් පමණ දුර
එනවා දිටිමි මිටි බැඳ ගෙන වියළි දර

III
දර ටික තබා සෙවනැති පලු ගසක යට
පිස දම දමා දාඩිය එන නළල පිට
මා එන තුරු ම සිට පෙන් වූ සිනහ කට
තවමත් පෙනේ දුක් දොම්නස් අතර මට

IV
පෙර දැක නොමැති මුත් සුන්දර හාමි විසින්
මගෙ තොරතුරු ඇසූ හැටි හිතවතෙකු ලෙසින්
ගෙඩියක් කඩා ගෙන ගෙමිදුල තැඹිලි ගසින්
පිළිගැන්වීය මට සොම්නස පිරුණු ඇසින්

V
පොල් දෙහි දොඩම් ගස් තුනහතරකි වත්තේ
දුප්පත්කමයි හැමතැන ලකුණුව ඇත්තේ
කෙළෙස ද කියා කළ ගුණ සැලකිය යුත්තේ
දුන් සත පනහවත් නැත ඔහු පිළිගත්තේ

(ලකුණු 10 යි)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

03. පද පූරණය කරන්න.

(i) හිතවත් කමින් පොහොසත්කම් කෙනෙකු ගමේ
ඔපවත් වේවි යහගුණදම් සැමගේ ලැමේ
..........................................................................................
..........................................................................................

(ii) පාවඩ එළා පා සෝදා වැඩම කල
නායක හිමිවරුන් දැක සතුටු හද මල
..........................................................................................
..........................................................................................

(iii) අඳුර ඉරා නැගෙනහිරින් දිනකර එනු දැක
..........................................................................................
..........................................................................................
..........................................................................................

(iv) රෝහල් ඇඳක කෙඳිරිලි නඟන හඬ දිගේ
බෝකල් විසුම අපහසු තමයි මට හැගේ
සෝ දුක් සුසුම්..........................................................................................
..........................................................................................

(v) දරුවන් අවදි කර උදයෙම කෑම කවා
..........................................................................................
..........................................................................................
..........................................................................................

04. පහත කවි පැනවලට අදාළ විරිතින් ම පිළිතුරු සපයන්න

(i) ගම්බද සිරිය දැක සැනසෙනු සිතිවිල්ලේ
පුන්සඳ දිලෙයි තරුවටකර නැළවිල්ලේ
රන්කඳ මගෙ පුතේ පැද්දුණු ඔංචිල්ලේ

(ii) පන්සල් පල්ලි කෝවිල් යන පිරිස සුඳට ඇඳලා
දන්සල් දෙති , නුඹ යනවද මිතුරන් සහ බැඳිලා

(iii) පිපුණත් නොයෙක් පාටින් සුවඳින් ගසක
වැදගත් වේ ද මල් පෙති හැලුනොත් දිනක

(iv) උදයෙ ම කුඹුරට බැහැලා
තනියම වී ටික ඉහලා
අපි වෙනුවෙන් වෙහෙසෙන්නේ
කියන්න කවුරු ද කියලා

(v) මහ පාරේ වැටී ඇවිදින දරුවො සහා
වැළපෙන මවක් , දැක බලමින් ඇයගේ දිහා
කෑමට යමක් නුඹ ළඟ තිබුණොතින් රහා
දෙනවද ඒක දෙවරක් නොසිතාම වහා (ලකුණු 10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

05. පහත දැක්වෙන චිත්‍රය මැනවින් නිරීක්ෂණය කොට ඔබගේ සිතේ හට ගන්නා කාව්‍යමය සංකල්ප පද්‍ය 10 කින් පමණ ඉදිරිපත් කරන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.



(ලකුණු 10)

## II කොටස

**පහත දැක්වෙන (අ) කොටසින් එකක් හෝ (ආ) කොටසින් එකක් හෝ තෝරාගෙන පද්‍ය 10 කට නො අඩු පද්‍ය රචනාවක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.**

(අ) පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරාගෙන පද්‍ය රචනා දෙකක් ලියන්න. රචනයක් සඳහා පද්‍ය 06 කට නොඅඩු විය යුතුය.

(i) " අනියත බව දනිමි සැම දෙය දිරන ලොවේ මිනිසෙකු මළ නිසයි දුක මරණයට නොවේ"

මාතෘකාව - **"අනියත දහම - මරණය"**

(ii) අ යනු ආ කියා -දැනුම් ලොව පෙන්නුවා දෙවි වරුන් වගේ උතුම් ගුරුවරුන් ඉන්නවා

මාතෘකාව - **"ගුරු දෙවිවරු නමදිමි"**

(iii) සුරංගනා ලොවින් ආවෙ උතුම් සිනා මුවින් පෑවේ

දෙමව්පියන් දුන්නේ ජීවේ පුතුන් රටක් වටියි කීවේ

මාතෘකාව - **"අනාගත දරු පරපුර"**

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(iv) කුසගිනි දැනී නෙත කඳුළක් වැටෙනු නොදී - පුළුවනි වවන්නට වතු පිටි කුඹුරු බැදී

මාතෘකාව - **"අපි වවමු රට නගමු"**

(v) තරු පොකුරු විසිරේ - නිදමි සඳ මැඳුරේ

මාතෘකාව - **"රාත්‍රියේ අසිරිය"**

**(ආ) (i)** ආර්ථික අපහසුතාවයෙන් සිටින දෙමාපියන් 10 දෙනෙකුගේ ,අධ්‍යාපනය ලබන සිසු දරුවන් 25 දෙනෙකු සඳහා ඉගෙනීමට අවශ්‍ය පොත් ලිපි ද්‍රව්‍ය හා සුදු රෙදි ප්‍රදානය කිරීමේ උත්සවයක ආරාධිත අමුත්තෙක් ලෙසින් විදුහල්පතිවරයෙක් / විදුහල්පතිවරියක් වන ඔබට එම අවස්ථාවට සහභාගී වීමට සිදුවූවායැයි සිතා එදින පවත්වන කතාව කවි දහයක් වන ලෙසට නිර්මාණය කරන්න.

**(ii) " සිංහරාජ වනාන්තරය කතා කරයි "** යන මාතෘකාව යටතේ කවි 10 කින් ඔබේ සිතිවිලි ලියන්න.

( ලකුණු 50 )